ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2468/04 - 2025 දෙසැම්බර් මස 22 වැනි සඳුදා - 2025.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය

**01. හැඳින්වීම**

නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් පළ කරන ලද නැගෙනහිර පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 193 සිට 206 දක්වා වන වගන්ති සහ විටින් විට සිදු කරන ලද සංශෝධනවලට අදාළ ප්‍රතිපාදන, නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ ආණ්ඩුකාර සංදේශ අංක 2026/01 සහ විටින් විට සිදු කරන ලද සංශෝධන සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම ප්‍රකාරව, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය තවදුරටත් ඉහළ නැංවීමේ හා නිලධාරීන්ගේ දැනුම හා නිපුණතාවයන් වැඩිදියුණු කර ගැනීම සඳහා නැගෙනහිර පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් 2026.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**02. අරමුණු**

I. නැගෙනහිර පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සියළු දෙනාම වාර්ෂික ස්ථාන මාරුවලට යටත් කිරීම.

II. නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ඇතැම් නිලධාරීන් වඩාත් ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානවල අඛණ්ඩව වසර ගණනාවක් සේවය කරන අතර, ඇතැම් නිලධාරීන් දුෂ්කර හෝ අති දුෂ්කර සේවා ස්ථානවල අඛණ්ඩව වසර ගණනාවක් සේවය කරන බැවින් ඇති වන අසමතුලිතාවය/ අසාධාරණ තත්ත්වයන් සමථයකට පත් කිරීම.

III. නැගෙනහිර පළාතේ එකම අමාත්‍යාංශයට හෝ එකම අමාත්‍යාංශයක් යටතේ පවතින දෙපාර්තමේන්තුවල හෝ එකම දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් වසර ගණනාවක් අඛණ්ඩව සේවය කරන බැවින් පැන නගින කාර්යාල පරිපාලනයේ ගැටළු විසඳීම සහ කාර්යාල මෙහෙයුම් කාර්යක්ෂම කිරීම.

IV. නැගෙනහිර පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ට පුළුල් ක්ෂේත්‍රයක අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සැලසීම හා වෘත්තීය සංවර්ධනයට හා හැකියාවන් සංවර්ධනයට අවස්ථාව සැලසීම.

1A - PG 7415 — 04 (2025/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

V. පළාත් රාජ්‍ය සේවයට අයත් ඒකාබද්ධ සේවයේ නිලධාරීන් දිස්ත්‍රික් අතර සේවයේ යෙදවීමේ අසමතුලිතතාවයන්, සමතුලිතතාවයට පත් කිරීම.

VI. නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ සියලුම සේවකයින්ට සේවා ස්ථාන සහ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් සමාන අයිතිවාසිකම් ලැබෙන බව සහතික කිරීම.

**03. වාර්ෂික ස්ථානමාරු කාල සටහන**

| | |
|---|---|
| ජුනි මස 01 වැනි දිනට පෙර | ස්ථාන මාරු මණ්ඩලය පිහිටුවීම |
| ජුනි මස 30 වැනි දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම |
| ජූලි මස 31 වැනි දිනට පෙර | අයදුම්පත් භාර ගැනීම |
| අගෝස්තු මස 10 වැනි දිනට පෙර | ස්ථාන මාරු අයදුම්පත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) කාර්යාලයේ ස්ථාන මාරු මණ්ඩලයට ඉදිරිපත් කිරීම. |
| අගෝස්තු මස 31 වැනි දිනට පෙර | ස්ථාන මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරු යෝජනා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) වෙත ඉදිරිපත් කිරීම. |
| සැප්තැම්බර් මස 15 වැනි දිනට පෙර | දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලට ස්ථාන මාරු නියෝග දැනුම් දීම හා වාර්ෂික ස්ථාන මාරු යෝජනා අභියාචනය සඳහා කමිටුව පත් කිරීම. |
| ඔක්තෝබර් මස 01 වැනි දිනට පෙර | ස්ථාන මාරු නියෝග පිළිබඳව අතෘප්තිමත් නිලධාරීන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරන අභියාචනා භාර ගැනීම |
| ඔක්තෝබර් මස 15 වැනි දිනට පෙර | ස්ථාන මාරු අභියාචනා සමාලෝචනය කිරීම |
| නොවැම්බර් මස 01 වැනි දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල තීරණ ප්‍රකාශ කිරීම |
| ජනවාරි මස 01 වැනි දිනට පෙර | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කළ යුතු දිනය |

**04. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර**

පහත සඳහන් නැගෙනහිර පළාත් ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් සඳහා මෙම ස්ථාන මාරු ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේ.

I. කළමනාකරණ සේවා නිලධාරී සේවය (III/II/I අධි ශ්‍රේණිය)
II. පළාත් භාෂා පරිවර්තක සේවය (III/II/I ශ්‍රේණිය)
III. සංවර්ධන නිලධාරී සේවය (III/II/I ශ්‍රේණිය)
IV. තාක්ෂණ නිලධාරී සේවය (III/II/I විශේෂ ශ්‍රේණිය)
V. තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී / සහකාර සේවය (III/II/I ශ්‍රේණිය)
VI. රියදුරු සේවය (III/II/I විශේෂ ශ්‍රේණිය)
VII. කාර්යාල කාර්ය සේවක සේවය (III/II/I විශේෂ ශ්‍රේණිය)

**05. සේවා ස්ථාන වර්ගීකරණය**

5.1 ස්ථාන මාරුවීම් සඳහා වැඩිම ඉල්ලුමක් ඇති සේවා ස්ථාන **"ඉතා ප්‍රියමනාප"** සේවා ස්ථාන ලෙස සලකනු ලැබේ.

I. රෝහල්
II. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල
III. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල
IV. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
V. පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය
VI. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
VII. පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
VIII. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
IX. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

5.2 ප්‍රධාන නගර සීමාව තුළ සහ ආසන්නයේ ප්‍රවාහන පහසුකම් සහිතව පවතින සේවා ස්ථාන "**ප්‍රියමනාප**" සේවා ස්ථාන ලෙස සළකනු ලැබේ. ඇමුණුම I

5.3 ප්‍රධාන නගර සීමාව තුළ සහ ආසන්නයේ පිහිටා නොමැති ප්‍රවාහන පහසුකම් අඩු සේවා ස්ථාන "**ප්‍රියමනාප නොවන**" සේවා ස්ථාන ලෙස සළකනු ලැබේ. ඇමුණුම II

(මෙම සේවා ස්ථාන වර්ගීකරණය සිදු කර ඇත්තේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා පමණක් පදනම් කරගනිමිනි.)

**06. වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් වන සේවා කාලය**

i. තම සේවා ස්ථානයේ වසර 03ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයඳුම් කිරීමට සුදුසුකම් ලබයි. එසේ ඉල්ලුම් කරන නිලධාරින් විසින් නම් කර ඇති සේවා ස්ථානයට ස්ථාන මාරුවීම් ලබා දීමට අවස්ථාවක් නොමැති නම් එම ඉල්ලීම සළකා බැලීම අනිවාර්යය නොවන අතර ඉල්ලීම් නොකළ සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීම ද සිදු නොකළ යුතු ය.

ii. දෙපාර්තමේන්තුවක වසර 05ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අනිවාර්යයෙන් අයඳුම් කළ යුතු ය. එසේ ඉල්ලුම් කර නොමැති නිලධාරින් ස්ථාන මාරු මණ්ඩලය විසින් අනිවාර්ය ස්ථාන මාරුවීම් යටතේ ස්ථාන මාරු කළ යුතු ය.

iii. අවුරුදු 55ක් ඉක්මවූ නිලධාරින් දිස්ත්‍රික්කය තුළ වෙනත් ස්ථානයකට ස්ථානමාරු කළ හැකි වුව ද, ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කිරීම නොකළ යුතු ය. වයස අවුරුදු 58 සම්පූර්ණ කළ නිලධාරින් ඔවුන්ගේ ඉල්ලීමකින් තොරව ස්ථාන මාරු කිරීම නොකළ යුතු ය.

iv. ස්ථාන මාරු සඳහා අයඳුම් කරන නිලධාරින් ස්ථාන මාරු අයඳුම්පතෙහි මාරුවීමට අපේක්ෂිත සේවා ස්ථාන 03ක් නම් කිරීමේ දී, තම වර්තමාන සේවා ස්ථානය අයත් වන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතට නොගැනෙන සේවා ස්ථානයක් නම් කිරීමට කටයුතු කළ යුතු ය. එසේම එකම අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතට නොගැනෙන සේවා ස්ථාන සඳහා ඉල්ලුම් කර ඇති නිලධාරින්ගේ ඉල්ලීම් සඳහා ප්‍රමුඛත්වය ලබාදීමෙන් පසුව අනෙකුත් නිලධාරින්ගේ ඉල්ලීම් සළකා බැලිය යුතු ය.

v. වාර්ෂික ස්ථානමාරු වලදී, ප්‍රධාන නගර සීමාවෙන් පිටත අඩු ප්‍රියමනාප සේවා ස්ථානවල වසර 05ක් සේවය කර ඇති නිලධාරින් හට ඉතා ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කිරීම සඳහා වන ඉල්ලීම්වලට ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

vi. පහත දක්වා ඇති කාණ්ඩවලට අයත් නිලධාරින් **ප්‍රධාන නගර සීමාවෙන් පිටත පිහිටි හෝ පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත වෙනත් දිස්ත්‍රික්කයක පිහිටි** සේවා අවශ්‍යතාවය ඇති පුරප්පාඩු සහිත සේවා ස්ථානයක් පවතී නම් ස්ථාන මාරු යටතේ එහි රාජකාරි කිරීමට අනිවාර්යයෙන් යටත් විය යුතු ය. එසේ ස්ථාන මාරු ලබන නිලධාරින් අනිවාර්ය වසර 03ක සේවා කාලයකට යටත් වේ.

| | |
|---|---|
| 01 | අඛණ්ඩව වසර 10ක් ස්ථිර පදිංචිය සහිත ග්‍රාම නිලධාරි වසම හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින ඉතා ප්‍රියමනාප (**5.1**)/ ප්‍රියමනාප සේවා ස්ථාන (**5.2 යටතේ ඇමුණුම I**) යටතට ගැනෙන සේවා ස්ථානවල සේවය කරන නිලධාරින් හෝ, |
| 02 | අඛණ්ඩව වසර 10ක් ප්‍රියමනාප සේවා ස්ථාන තෝරාගැනීම මත පදනම්ව ඉතා ප්‍රියමනාප (**5.1**)/ ප්‍රියමනාප සේවා ස්ථාන (**5.2 යටතේ ඇමුණුම I**) වල සේවය කරන නිලධාරින් |

**07. සේවා කාලය ගණනය කිරීම**

i. වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සේවා කාලය ගණනය කරනු ලබන්නේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 යන දිනට ය.

ii. සේවා කාලය ගණනය කිරීමේ දී, වාර්ෂික ස්ථාන මාරු නියෝගයට අනුව නිලධාරියෙකු නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ යුතු දිනය ජනවාරි මාසයේ පළමු වැඩ කරන දිනට යෙදුන ද, වාර්තා කළ දිනය මාසයේ කුමන දිනය වුවත්, ජනවාරි

පළමු දිනය ඔහුගේ පළමු සේවා දිනය ලෙස සලකා බැලිය යුතු ය. කෙසේ වෙතත් නිලධාරින්ගේ පාලනයෙන් ඔබ්බට ගිය කිසියම් හේතුවක් මත සේවයට වාර්තා කිරීමේ දිනය ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක වන දිනට වඩා පසු දිනයක යෙදුනේ නම්, ස්ථාන මාරු කමිටුව ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ය. (තව ද නිලධාරියෙකු තම පාලනයෙන් ඔබ්බට ගිය හේතුවක් නිසා සේවයෙන් බැහැරව සිටින කාල සීමාව සේවා කාලය සලකා බැලීමේ දී අදාළ කර ගත යුතු නොවේ.)

iii. වාර්ෂික ස්ථාන මාරු සඳහා සේවා කාලය ගණනය කිරීමේ දී අභ්‍යාසලාභී පුහුණුවකට යටත් වන නිලධාරින්ගේ පත්වීම් දිනය ලෙස සලකනු ලබන්නේ නිලධාරියාගේ අභ්‍යාසලාභී පුහුණුව ආරම්භ කළ දිනය නොව පුහුණුකාලය අවසන්ව සේවා ස්ථානයේ වැඩ භාරගත් දිනය යි.

iv. ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකුට නැවත ඔහුගේ සේවා කාලය තුළ දී එම සේවා ස්ථානයේ සේවය කළ නොහැකි ය. එමෙන් ම නැවත ඉතා ප්‍රියමනාප වෙනත් සේවා ස්ථානයකට මාරු වීමට ඉල්ලුම් කළ හැක්කේ ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයෙන් පිටතට ගොස් වසර 10ක් ගත වී ඇත්නම් පමණි.

v. ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කරන සහ සේවය කළ නිලධාරින් නැවත එවැනි සේවා ස්ථානයකට ස්ථාන මාරු ලබා ගැනීම සඳහා කරන ස්ථාන මාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ ඉහත සේවා ස්ථාන හැර අඩු ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කරන නිලධාරින් විසින් එම සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීම සඳහා කරන ලද ඉල්ලීම් සළකා බැලීමෙන් පසුව පමණි.

vi. එක් සේවයකට වඩා වැඩි සේවාවන් ගණනක සේවය කර ඇති නිලධාරින්ගේ ඉතා ප්‍රියමනාප/ ප්‍රියමනාප සේවා ස්ථානවල සේවා කාලය ගණනය කිරීමේ දී, පෙර සේවයේ සේවය කළ සේවා ස්ථාන සැළකිල්ලට ගනිමින් මුළු සේවා කාලය ගණනය කරනු ලැබේ.

**08. අයදුම්පත් ඉදිරිපත් කරන ක්‍රමවේදය**

i. වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ස්ථාන මාරුවීම් ලබාගත් බව ඔප්පු වුවහොත්, එම කරුණ සමාලෝචන කමිටුව විසින් සළකා බලනු ලබන අතර, ඒ පිළිබඳව අවධානය යොමු කොට නව ස්ථාන මාරු නියෝග ලබා දීමට පියවර ගනු ලැබේ. එවැනි නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් සළකා බලනු නොලැබේ. මෙසේ වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන නිලධාරින්ට විරුද්ධව පවතින නීති රීති සහ රෙගුලාසි අනුව උපරිම විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ii. වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමේ දී, ඒ සඳහා හඳුන්වා දී ඇති ආකෘතියට අනුකූලව සකස් කර ඉදිරිපත් කරන ලද අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ. (ආකෘතිය - 01)

iii. ස්ථාන මාරුවීම් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම නිලධාරින් තමන් ස්ථාන මාරු ලැබීමට කැමති ඕනෑම සේවා ස්ථාන 03ක් සඳහන් කරමින් සකස් කරන ලද ආකෘතිය - 01 පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය. එලෙස ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්වල ඉල්ලන ලද / සඳහන් කර ඇති ස්ථානවලට ස්ථාන මාරු ලබාදීම මෙම ස්ථාන මාරු ප්‍රතිපත්තියේ දක්වා ඇති කොන්දේසි මත පදනම්ව ලබාදෙනු ලබන අතර, එලෙස ඉල්ලා සිටින ස්ථානයට ස්ථාන මාරු කිරීම ලබා දිය නොහැකි නම්, ස්ථානමාරු කොන්දේසි වලට යටත්ව වෙනත් ස්ථානයකට ස්ථාන මාරුව ලබා දෙනු ලැබේ.

iv. ස්ථාන මාරු කරන අවස්ථාවේ දී දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩලයේ අතිරික්තයක් තිබේ නම්, එම නිලධාරින්ගෙන් වැඩිම කාලයක් සේවය කර ඇති නිලධාරින් පිළිබඳ සැළකිල්ල යොමු කරමින්, ස්ථාන මාරු සඳහා සුදුසුකම් ඇති අය ස්ථාන මාරු කිරීමට යටත් කරනු ලැබේ. කෙසේ වෙතත්, මේ අය සඳහා අනුප්‍රාප්තිකයින් ලබා දෙනු නොලැබේ.

**09. විශේෂිත කරුණු**

i. සාමාන්‍යයෙන් නිලධාරින්ගේ ඉල්ලීමට අනුව තම කාලත්‍රයා රජයේ නිලධාරියෙකු නම් කලත්‍රයාගේ සේවා ස්ථානය පිහිටා ඇති ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට ස්ථාන මාරු ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු ය.

ii. ස්ථාන මාරු සිදු කිරීමේ දී කිරිදෙන මව්වරුන්, පාසල් යන දරුවන්, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් හා දීර්ඝ කාලීන රෝගවලින් පෙළෙන එක්තැන් වූ කලත්‍රයෙකු හෝ කලත්‍රයා විදේශගත වී සිටින ආදී වශයෙන් පිළගත හැකි කරුණු ඉදිරිපත් කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන අයදුම්පත් ස්ථාන මාරු ලබාදීමේ දී සළකා බැලිය යුතු ය.

iii. විශේෂ අවශ්‍යතා සහිතව සේවයට බඳවාගත් නිලධාරීන් විසින් ඉල්ලා සිටින සේවා ස්ථාන තුනෙන් එකකට ස්ථාන මාරු කිරීමට පියවර ගත යුතු ය. කෙසේ වෙතත් මෙම පදනමින් බඳවාගත් නිලධාරීන් ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරන්නේ නම් ඉහත විධිවිධාන අදාළ කරගත යුතු නොවේ.

iv. වාරිමාර්ග ක්ෂේත්‍රයේ සේවය කරන තාක්ෂණික සේවයේ නිලධාරීන් ඔවුන් දැනට සේවය කරන ක්ෂේත්‍රය තුළ පමණක් ස්ථාන මාරු කරන අතර, අනෙකුත් ක්ෂේත්‍රවල සේවය කරන තාක්ෂණික සේවයේ නිලධාරීන් අර්ධ වශයෙන් වෙනත් ක්ෂේත්‍ර වෙත ස්ථාන මාරු කරනු ලැබේ. කෙසේ වෙතත්, වාරිමාර්ග ක්ෂේත්‍රයේ සේවය කරන අදාළ සේවයේ නිලධාරීන් වෙනත් ක්ෂේත්‍රයක සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන අවස්ථාවක දී පවතින පුරප්පාඩු මත පදනම්ව එම ක්ෂේත්‍ර වෙත ස්ථාන මාරු කිරීමට සළකා බැලිය යුතු ය. එසේ නොවන අවස්ථාවල දී එකම ක්ෂේත්‍රයක දිස්ත්‍රික් අතර ස්ථාන මාරු ලබාදිය යුතු ය.

v. ස්ථාන මාරු අයදුම්පත් කැඳවා ඇති සහ ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ ඉදිරිපත් කරන ලද සුහද සහ අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

vi. පහත දැක්වෙන හේතු මත ස්ථාන මාරුවීම් සිදු කිරීම වාර්ෂික ස්ථාන මාරු යටතට නොගැනේ.

(අ) සේවා අවශ්‍යතාවය මත;
(ආ) සුහද ස්ථාන මාරු;
(ඇ) පත් කළ රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත;
(ඈ) සේවා ස්ථානයේ වෙනසක් නොවන මාරු කිරීම්;
(ඉ) විනය හේතු මත.

**10. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ රාජකාරි සහ වගකීම්**

i. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් සත්‍ය හා සම්පූර්ණ විස්තර ලබාදීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම වේ. අසත්‍ය හා අසම්පූර්ණ තොරතුරු ලබාදී ඇති බවට පෙනී ගියහොත් ඒ සම්බන්ධයෙන් අදාළ ප්‍රධානියා හා එවැනි ලැයිස්තු සකස් කරන ලද විෂය නිලධාරීන් ද වගකිව යුතු අතර එවැනි නිලධරයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු ය.

ii. ස්ථාන මාරු නියෝග ලැබී ඇති නිලධාරීන් ඔවුන්ට අදාළ අනුප්‍රාප්තිකයින් සේවයට වාර්තා කරන තුරු රඳවා තබා නොගෙන නියමිත දිනට නව සේවා ස්ථානයෙහි රාජකාරි භාරගැනීමට හැකි වන පරිදි ඔවුන් නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා වහාම පියවර ගත යුතු ය.

iii. ඇතැම් දෙපාර්තමේන්තු සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් නියමිත දිනට එම දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කර ඇතත්, එම දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානින් විසින් නිදහස් කර නොමැති බව නිරීක්ෂණය වේ. එවැනි අවස්ථා ඇති නොවන පරිදි අදාළ නිලධාරීන් නිදහස් කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීමකි. අදාළ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් අවලංගු කිරීමට හෝ අමතර කාලයක් සේවය කිරීමට ඉඩ දීමට හෝ නිසි අවසරයක් ලබා නොගෙන අදාළ නිලධාරීන්ගේ වැටුප් ගෙවන්නේ නම්, ඒ සඳහා ආයතන ප්‍රධානීන් වගකීම භාරගත යුතු ය.

iv. ස්ථාන මාරු ලබා තම සේවා ස්ථානයෙන් නිදහස් කරන ලදුව, නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් නව සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සේවය හැර යාමේ නියෝග නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය. එහි පිටපතක් පෙර සේවය කළ සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමුකළ යුතු ය.

v. ඒකාබද්ධ සේවයට අයත් සියලුම නිලධාරීන් ඔවුන් යොදවා ඇති කාර්යය කොතරම් වැදගත් යැයි සැලකුව ද ස්ථාන මාරු සඳහා යටත් වන උපරිම සේවා කාලය (වසර 05) අවසන් වීමට පෙර හෝ ආසන්න වන විට අදාළ විෂය සම්බන්ධයෙන් වෙනත් නිලධාරියෙකුට පුහුණුව ලබාදීම සහ ඔහු/ඇය අඛණ්ඩව එකම සේවා ස්ථානයේ තබා ගැනීමට උත්සාහ නොකිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම වේ. එසේ කිරීම මෙම ප්‍රතිපත්තියෙහි 2 වන ඡේදයේ II වගන්තිය උල්ලංඝනය කිරීමක් ලෙස සළකනු ලැබේ.

vi. ස්ථාන මාරු ලැබීමට ඉඩ ඇති නිලධාරින් (වසර 05ක් සම්පූර්ණ කරන ලද නිලධාරින්) සේවා අවශ්‍යතාවය මත තවත් එක් වසරක් දෙපාර්තමේන්තුවේ රඳවා ගත යුතු යැයි දෙපාර්තමේන්තු ප්‍රධානියා අදහස් කරන්නේ නම් අදාළ ඉල්ලීම සුදුසු හේතු සහිතව නිර්දේශ කර අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ පෞද්ගලික නිර්දේශය සහිතව අදාළ අයදුම්පත නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන වෙත ඉදිරිපත් කළ යුතු ය. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන විසින් ඒ සම්බන්ධයෙන් ස්ථාන මාරු මණ්ඩලය දැනුවත් කර පිළිගත හැකි හේතු තිබේ නම් ඒ අනුව අවශ්‍ය පියවර ගනු ලැබේ. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින් ඉල්ලීම් ඉදිරිපත් කළ හැක්කේ ඔහුගේ කාර්යාලයේ සේවය කරන නිලධාරින් අතරින් එක් සේවාවකට අයත් එක් නිලධරයෙකු වෙනුවෙන් පමණි. එක් අවස්ථාවක දී එසේ අවස්ථාව ලබාදෙන ලද නිලධාරියෙකුට නැවතත් අවස්ථාවක් ලබාදෙනු නොලැබේ. කෙසේ වෙතත් සේවයේ අවශ්‍යතා මත පදනම්ව මෙම කරුණ සම්බන්ධයෙන් ස්ථාන මාරු මණ්ඩලයේ තීරණය අනුව කටයුතු කළයුතු වේ. කෙසේ වෙතත්, ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක් සම්පූර්ණ කළ නිලධාරියෙකු දිගින් දිගටම එම කාර්යාලයේ රඳවා ගැනීම නුසුදුසු වන අතර එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vii. ආකෘතිය - 01 මගින් ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව, ආකෘතිය - 02 හා ආකෘතිය - 03 සම්පූර්ණ කර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන වෙත ජූලි මස 31 වැනි දිනට පෙර ලැබෙන සේ ඍජුව යොමු කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම වේ.

viii. ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දී සේවාවේ අවශ්‍යතාව සැළකිල්ලට ගත යුතු අතර හැකි සෑම අවස්ථාවකදීම ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ නිලධාරින් අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීමට පියවර ගත යුතු ය.

ix. මෙම ප්‍රතිපත්තියේ සඳහන් විධිවිධාන, ස්ථාන මාරු මණ්ඩලයේ තීරණ හා අභියාචනා මණ්ඩලයේ තීරණ ආදිය www.ep.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කරගෙන අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ සේවය කරන සියලු නිලධාරීන්ගේ අවධානයට යොමු කර, එම නිලධාරීන් වෙත දැනගැනීමට සැළැස්වීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම වේ.

**11. වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවේ සාමාජිකයින්ගේ විස්තර**

නැගෙනහිර පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරින්ගේ ස්ථාන මාරු කමිටුව පත් කරනු ලබන්නේ ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය අනුව නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් විසිනි.

නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පළ කරන ලද නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 187 වන වගන්තියෙහි විධිවිධාන සහ විටින් විට සිදු කරන ලද සංශෝධන ප්‍රකාරව නැගෙනහිර පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදිවේ.

**සභාපති**

1. නැගෙනහිර පළාත් සභාවේ සේවය කරන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක්;

**සාමාජිකයන්**

1. පළාත් අමාත්‍යාංශ නියෝජනය කරමින් එම අමාත්‍යාංශය හෝ ඒ යටතේ පවතින ඕනෑම කාර්යාලයක සේවය කරන දීප ව්‍යාප්ත සේවයක මාණ්ඩලික නිලධාරින් තිදෙනෙක්;

2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) කාර්යාලයේ සහකාර ප්‍රධාන ලේකම් හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) විසින් නම් කරන ලද නිලධාරියෙකු.

එමෙන් ම වාර්ෂික ස්ථාන මාරු කමිටුවෙහි විෂය ක්ෂේත්‍රයට අයත් පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරි කාණ්ඩවලට සහ සේවයට අයත් පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් ඇති වෘත්තීය සමිතිවලින් නම් කරනු ලබන එක් නියෝජිතයෙකු හෝ පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කර ඇති එක් නිලධාරියෙකු නැගෙනහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් පරිපාලන වෙත නියමිත තොරතුරු ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයට සහභාගි විය හැකි ය.

**12. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම.**

i. ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන නියෝගයන්ට එරෙහිව ඕනෑම රජයේ නිලධාරියෙකු විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් එම නිලධාරියාට ස්ථාන මාරු නියෝගය තම ආයතන

ප්‍රධානියා විසින් දන්වන ලද දින සිට දින 14ක් ඇත්ළත ඉදිරිපත් කළ යුතු ය. අදාළ කාලය තුළ ඉදිරිපත් කර නොමැති අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙසේ වෙතත්, අදාළ නිලධාරියාගේ පාලනයෙන් ඔබ්බට ගිය හේතූන් මත ඉදිරිපත් කිරීමට නොහැකි වූ අභියාචනා සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන විසින් සුදුසු තීරණ ගනු ලැබේ.

ii. කිසියම් ස්ථාන මාරුවීමකට එරෙහිව සිදු කරනු ලබන අභියාචනයක දී අදාළ නිලධාරියා විසින් ම එම අභියාචනය ඔහුගේ/ ඇයගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු අතර, ඔහු/ඇය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියෙකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සළකා බලනු නොලැබේ.

iii. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචනය කිරීම සඳහා වන කමිටුවේ විස්තර ස්ථාන මාරු නියෝගයට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පරීක්ෂා කිරීම සඳහා නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන සහ විටින් විට සිදු කරනු ලබන සංශෝධනවලට අනුව අභියාචනා මණ්ඩලයක් පත් කර අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

iv. නැගෙනහිර පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචනය කිරීම සඳහා වන කමිටුව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් පත්කරනු ලැබේ. එහි සභාපති හා සාමාජිකයින් පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත වේ.

i. සභාපති - නැගෙනහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන)

ii. සාමාජික - නැගෙනහිර පළාත් සභාවේ සේවය කරන ශ්‍රී ලංකා දීප ව්‍යාප්ත සේවයට අයත් I හෝ II ශ්‍රේණියේ නිලධාරියෙකු

iii. සමාජික - වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයට අයත් එක් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු.

**13. වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය**

ඒකාබද්ධ සේවාවන් හා සම්බන්ධ ලියාපදිංචි වෘත්තීය සමිතියක සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික හා මධ්‍යම කාරක සභා සභිකයින් ස්ථාන මාරු කරන්නේ නම් එම වෘත්තීය සමිතියේ ලේකම්ගේ නිර්දේශය සළකා බලනු ලැබේ. (මෙම විධිවිධාන වෘත්තීය සමිතියේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන නිලධාරීන්ට පමණක් අදාළ වේ.) වෘත්තීය සමිති මීට අදාළ විස්තර ජූලි මස 31 දිනට පෙර නැගෙනහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන වෙත යොමු කළ යුතු ය. ජූලි 31 දිනට පසුව ලැබෙන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

**14. පොදු කරුණු**

මෙම ප්‍රතිපත්තියට වරින් වර සිදුකරනු ලබන සංශෝධනයන්ට අනුකූලව නිලධාරීන් කටයුතු කළයුතු අතර මෙම ප්‍රතිපත්තියෙහි සඳහන් නොවන විධිවිධාන සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) විමසා කටයුතු කළ යුතු වේ.

තව ද, මෙම ස්ථාන මාරු ප්‍රතිපත්තිය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය යටතේ හා නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කරනු ලැබේ.

මෙම ප්‍රතිපත්තිය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය යටතේ හා නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත අවශ්‍ය අවස්ථා වලදී සංශෝධනය කළ හැකි ය.

සිංහල සහ දෙමළ භාෂා වලින් පළ කරන ලද මෙම ප්‍රතිපත්තියේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලත්වයක් ඇතිවුවහොත්, එවැනි විටෙක සිංහල මාධ්‍ය භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**ටී. ඒ. සී. එන්. තලංගම,**
ප්‍රධාන ලේකම්,
නැගෙනහිර පළාත.

Annexure I

**Department/Institution with in Town or Transportation Facilities**

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 1 | Governor's Secretariat |
| 2 | PPSC |
| 3 | Provincial Council Secretariat |
| 4 | Chief Secretary's Secretariat |
| 5 | Office of the Deputy Chief Secretary - Administration |
| 6 | Office of the Deputy Chief Secretary - Eng.Services |
| 7 | Office of the Deputy Chief Secretary - Finance |
| 8 | Office of the Deputy Chief Secretary - Personal and Training |
| 9 | Office of the Deputy Chief Secretary - Planning |
| 10 | Dept. of Motor Traffic |
| 11 | Divisional Secretariat - Addalaichchenai |
| 12 | Divisional Secretariat - Akkaraipattu |
| 13 | Divisional Secretariat - Alayadivembu |
| 14 | Divisional Secretariat - Ampara |
| 15 | Divisional Secretariat - Eravur Town |
| 16 | Divisional Secretariat - Eravurpattu (Chenkalady) |
| 17 | Divisional Secretariat - Kalmunai (M) |
| 18 | Divisional Secretariat - Kalmunai (T) |
| 19 | Divisional Secretariat - Karaitivu |
| 20 | Divisional Secretariat - Kattankudy |
| 21 | Divisional Secretariat - Kinniya |
| 22 | Divisional Secretariat - Koralaipattu (Valaichenai) |
| 23 | Divisional Secretariat - Koralaipattu Central (Valaichenai) |
| 24 | Divisional Secretariat - Koralaipattu West (Oddamavadi) |
| 25 | Divisional Secretariat - Manmunai North (Batticaloa) |
| 26 | Divisional Secretariat - Manmunai South Eruvilpattu (Kaluwanchikudy) |
| 27 | Divisional Secretariat - Manmunaipattu (Arayampathy) |
| 28 | Divisional Secretariat - Muthur |
| 29 | Divisional Secretariat - Ninthavur |
| 30 | Divisional Secretariat - Sainthamaruthu |
| 31 | Divisional Secretariat - Sammanthurai |
| 32 | Divisional Secretariat - Town and Gravets |
| 33 | Dept. of Revenue |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 34 | MDTU |
| 35 | Dept. of Audit |
| 36 | Provincial ICT Unit |
| 37 | Legal Unit |
| 38 | **Chief Minister's Secretariat** |
| 39 | Dept. of Local Government |
| 40 | ACLG Ampara |
| 41 | ACLG Batticaloa |
| 42 | ACLG Trincomalee |
| 43 | Addalaichenai Pradeshiya Sabha |
| 44 | Akkaraipattu Municipal Council |
| 45 | Akkaraipattu Pradeshiya Sabha |
| 46 | Alayadivembu Pradeshiya Sabha |
| 47 | Ampara Urban Council |
| 48 | Batticaloa Municipal Council |
| 49 | Eravur Urban Council |
| 50 | Eravurpattu Pradeshiya Sabha (Chenkalady) |
| 51 | Kalmunai Municipal Council |
| 52 | Karaitivu Pradeshiya Sabha |
| 53 | Kattankudy Urban Council |
| 54 | Kinniya Pradeshiya Sabha |
| 55 | Kinniya Urban Council |
| 56 | Koralaipattu Pradeshiya Sabha (Valaichenai) |
| 57 | Koralaipattu West Pradeshiya Sabha (Oddamavadi) |
| 58 | Manmunai South Eruvilpattu Pradeshiya Sabha (Kaluthawalai) |
| 59 | Manmunaipattu Pradeshiya Sabha (Arayampathy) |
| 60 | Muthur Pradeshiya Sabha |
| 61 | Ninthavur Pradeshiya Sabha |
| 62 | Sammanthurai Pradeshiya Sabha |
| 63 | Town and Gravates Pradeshiya Sabha |
| 64 | Trincomalee Urban Council |
| 65 | Dept. of Rural Development |
| 66 | Dept. of Rural Industries |
| 67 | Rural Industries - District Office Ampara |
| 68 | Rural Industries - District Office Batticaloa |
| 69 | Rural Industries - District Office Trincomalee |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 70 | Dept. of Buildings |
| 71 | Building CE Office - Batticaloa |
| 72 | Building CE Office - Kalmunai |
| 73 | Building CE Office - Trincomalee |
| 74 | Building EE Office - Batticaloa |
| 75 | Building EE Office - Kalmunai |
| 76 | Building EE Office - Trincomalee |
| 77 | Tourism Bureau |
| 78 | Tourism District Office - Ampara |
| 79 | Tourism District Office - Batticaloa |
| 80 | **Ministry of Agriculture** |
| 81 | Dept. of Agriculture |
| 82 | DDA Ampara |
| 83 | DDA Batticaloa |
| 84 | DDA Trincomalee |
| 85 | Dept. of Animal Production & Health |
| 86 | Deputy Veterinary Surgeon Office - Ampara |
| 87 | Deputy Veterinary Surgeon Office - Batticaloa |
| 88 | Deputy Veterinary Surgeon Office - Trincomalee |
| 89 | Goat Breeder Farm Sathurukondan |
| 90 | Regional Livestock Farm - Uppuveli |
| 91 | Regional Training Centre - Kallady |
| 92 | Regional Training Centre - Uppuveli |
| 93 | Veterinary Surgeon Office - Addalaichchenai |
| 94 | Veterinary Surgeon Office - Akkaraippattu |
| 95 | Veterinary Surgeon Office - Alayadivembu |
| 96 | Veterinary Surgeon Office - Ampara |
| 97 | Veterinary Surgeon Office - Arayampathy |
| 98 | Veterinary Surgeon Office - Batticaloa |
| 99 | Veterinary Surgeon Office - Chenkalady |
| 100 | Veterinary Surgeon Office - Eravur Town |
| 101 | Veterinary Surgeon Office - Gopalapuram |
| 102 | Veterinary Surgeon Office - Kalmunai (M) |
| 103 | Veterinary Surgeon Office - Kalmunai (T) |
| 104 | Veterinary Surgeon Office - Kaluwanchikudy |
| 105 | Veterinary Surgeon Office - Kantalai |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 106 | Veterinary Surgeon Office - Karaitivu |
| 107 | Veterinary Surgeon Office - Kattankudy |
| 108 | Veterinary Surgeon Office - Kinniya |
| 109 | Veterinary Surgeon Office - Kiran |
| 110 | Veterinary Surgeon Office - Muthur |
| 111 | Veterinary Surgeon Office - Ninthavur |
| 112 | Veterinary Surgeon Office - Oddamavady |
| 113 | Veterinary Surgeon Office - Sainthamaruthu |
| 114 | Veterinary Surgeon Office - Sammanthurai |
| 115 | Veterinary Surgeon Office - Trincomalee |
| 116 | Dept. of Irrigation |
| 117 | Irrigation DDI Office - Batticaloa |
| 118 | Irrigation DDI Office - Kalmunai |
| 119 | Irrigation DDI Office - Trincomalee |
| 120 | Irrigation IE Office - Ampara |
| 121 | Irrigation IE Office - Chenkalady |
| 122 | Irrigation IE Office - Kuchchaveli |
| 123 | Irrigation IE Office - Paddiruppu |
| 124 | Irrigation IE Office - Pottuvil |
| 125 | Irrigation IE Office - Trincomalee |
| 126 | Dept. of Co-operative Development |
| 127 | ACCD Ampara |
| 128 | ACCD Batticaloa |
| 129 | ACCD Kalmunai |
| 130 | ACCD Trincomalee |
| 131 | Fisheries Unit |
| 132 | Co-operative Employees Commission |
| 133 | **Ministry of Education** |
| 134 | Dept. of Education |
| 135 | ZEO Akkaraipattu |
| 136 | ZEO Ampara |
| 137 | ZEO Batticaloa |
| 138 | ZEO Eravur (Central) |
| 139 | ZEO Kalkudah |
| 140 | ZEO Kalmunai |
| 141 | ZEO Kinniya |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 142 | ZEO Muthur |
| 143 | ZEO Paddiruppu |
| 144 | ZEO Sammanthurai |
| 145 | ZEO Trincomalee |
| 146 | Dept. of Cultural Affairs |
| 147 | Dept. of Sports |
| 148 | **Ministry of Health** |
| 149 | Provincial Dept. of Health Services |
| 150 | RDHS - Ampara |
| 151 | RDHS - Batticaloa |
| 152 | RDHS - Kalmunai |
| 153 | RDHS - Trincomalee |
| 154 | Base Hospital - Eravur |
| 155 | Base Hospital - Kaluwanchikudy |
| 156 | Base Hospital - Kattankudy |
| 157 | Base Hospital - Kinniya |
| 158 | Base Hospital - Muthur |
| 159 | Base Hospital - Ninthavur |
| 160 | Base Hospital - Sammanthurai |
| 161 | Base Hospital - Valaichchenai |
| 162 | Chest Clinic |
| 163 | District Hospital - Chenkalady |
| 164 | District Hospital - Periyakallar |
| 165 | District Hospital - Sainthamaruthu |
| 166 | Mental Health Rehabilitation Centre |
| 167 | STD Clinic |
| 168 | MOH - Addalaichenai |
| 169 | MOH - Akkaraipattu |
| 170 | MOH - Alayadivembu |
| 171 | MOH - Ampara |
| 172 | MOH - Arayampathy |
| 173 | MOH - Batticaloa |
| 174 | MOH - Chenkalady |
| 175 | MOH - Eravur |
| 176 | MOH - Kalmunai (N) |
| 177 | MOH - Kalmunai (S) |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 178 | MOH - Kaluwanchikudy |
| 179 | MOH - Karaitivu |
| 180 | MOH - Kattankudy |
| 181 | MOH - Kinniya |
| 182 | MOH - Kiran |
| 183 | MOH - Koralaipattu Central |
| 184 | MOH - Muthur |
| 185 | MOH - Ninthavur |
| 186 | MOH - Oddamavadi |
| 187 | MOH - Sainthamaruthu |
| 188 | MOH - Sammanthurai |
| 189 | MOH - Trincomalee |
| 190 | MOH - Uppuveli |
| 191 | Dept. of Indigenous Medicine |
| 192 | Ayurvedic Base Hospital - Puthukudiyiruppu |
| 193 | Base Ayurvedic Hospital - Addalaichchenai |
| 194 | CAD - Akkaraipattu |
| 195 | CAD - Alankulam |
| 196 | CAD - Alayadyvembu |
| 197 | CAD - Kallady |
| 198 | CAD - Karaitivu |
| 199 | CAD - Kattankudy |
| 200 | CAD - Kinniya |
| 201 | CAD - Kokkadichcholai |
| 202 | CAD - Maruthamunai |
| 203 | CAD - Meeranagar |
| 204 | CAD - Muthur |
| 205 | CAD - Natpiddimunai |
| 206 | CAD - Oddamavadi |
| 207 | CAD - Oluvil |
| 208 | CAD - Sainthamaruthu |
| 209 | CAD - Sammanthurai |
| 210 | CAD - Sathurukondan |
| 211 | CAD - Soorangal |
| 212 | CAD - Thetativu |
| 213 | CAD - Thoppur |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 214 | CAD - Vantharumoolai |
| 215 | District Ayurvedic Hospital - Eravur |
| 216 | District Ayurvedic Hospital - Ninthavur |
| 217 | Panchakarma Hospital - Kattankudy |
| 218 | Panchakarma Hospital - Puthukudiyiruppu |
| 219 | RAH - Gopalapuram |
| 220 | RAH - Onthachimadam |
| 221 | Dept. of Social Services |
| 222 | Social Services District Office - Ampara |
| 223 | Social Services District Office - Batticaloa |
| 224 | Social Services District Office - Trincomalee |
| 225 | VTC - Trincomalee |
| 226 | Dept. of Probation |
| 227 | Akkaraipattu Probation Unit |
| 228 | Ampara Probation Unit |
| 229 | Batticaloa Probation Unit |
| 230 | Chenkalady Probation Unit |
| 231 | Kaluwanchikudy Probation Unit |
| 232 | Muthur Probation Unit |
| 233 | Safe House - Batticaloa |
| 234 | Safe House - Trincomalee |
| 235 | Sammanthurai Probation Unit |
| 236 | Trincomalee Probation Unit |
| 237 | Valaichenai Probation Unit |
| 238 | **Ministry of Road Development** |
| 239 | Dept. of Road Development |
| 240 | Road CE Office - Ampara |
| 241 | Road CE Office - Batticaloa |
| 242 | Road CE Office - Kalmunai |
| 243 | Road CE Office - Trincomalee |
| 244 | Road EE Office - Ampara |
| 245 | Road EE Office - Batticaloa |
| 246 | Road EE Office - Kalmunai |
| 247 | Road EE Office - Trincomalee |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 248 | Dept. of Land Administration |
| 249 | Land District Office - Ampara |
| 250 | Land District Office - Batticaloa |

**Annexure II**

**Depatment/ Institutional within Rural , Remote and Poor**

**Transportation facilities**

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| **Motor taffic department / Rural Dev.Dept / Social Ser. Dept. / Probation** | |
| 1 | Divisional Secretariat - Damana |
| 2 | Divisional Secretariat - Dehiyatakandiya |
| 3 | Divisional Secretariat - Gomarangadawela |
| 4 | Divisional Secretariat - Irakkamam |
| 5 | Divisional Secretariat - Kantalai |
| 6 | Divisional Secretariat - Koralaipattu North (Vaharai) |
| 7 | Divisional Secretariat - Koralaipattu South (Kiran) |
| 8 | Divisional Secretariat - Kuchchaveli |
| 9 | Divisional Secretariat - Lahugala |
| 10 | Divisional Secretariat - Mahaoya |
| 11 | Divisional Secretariat - Manmunai South West (Paddipalai) |
| 12 | Divisional Secretariat - Manmunai West (Vavunativu) |
| 13 | Divisional Secretariat - Morawewa |
| 14 | Divisional Secretariat - Navithanveli |
| 15 | Divisional Secretariat - Padavisripura |
| 16 | Divisional Secretariat - Padiyathalawa |
| 17 | Divisional Secretariat - Porativupattu (Vellavely) |
| 18 | Divisional Secretariat - Pottuvil |
| 19 | Divisional Secretariat - Seruwila |
| 20 | Divisional Secretariat - Thampalagamam |
| 21 | Divisional Secretariat - Thirukkovil |
| 22 | Divisional Secretariat - Uhana |
| 23 | Divisional Secretariat - Verugal |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| | Chief Minister's Secretariat |
| 24 | Damana Pradeshiya Sabha |
| 25 | Dehiyattakandya Pradeshiya Sabha |
| 26 | Gomarankadawela Pradeshiya Sabha |
| 27 | Irrakkamam Pradeshiya Sabha |
| 28 | Kanthalai Pradeshiya Sabha |
| 29 | Koralaipattu North Pradeshiya Sabha (Vaharai) |
| 30 | Kuchchaveli Pradeshiya Sabha |
| 31 | Lahugala Pradeshiya Sabha |
| 32 | Mahaoya Pradeshiya Sabha |
| 33 | Manmunai South West Pradeshiya Sabha (Paddipalai) |
| 34 | Manmunai West Pradeshiya Sabha (Vavunativu) |
| 35 | Morawewa Pradeshiya Sabha |
| 36 | Namaloya Pradeshiya Sabha |
| 37 | Navithanveli Pradeshiya Sabha |
| 38 | Padavisripura Pradeshiya Sabha |
| 39 | Padiyatalawa Pradeshiya Sabha |
| 40 | Porativupattu Pradeshiya Sabha (Vellavely) |
| 41 | Pottuvil Pradeshiya Sabha |
| 42 | Seruwila Pradeshiya Sabha |
| 43 | Thamplakamam Pradeshiya Sabha |
| 44 | Thirukovil Pradeshiya Sabha |
| 45 | Uhana Pradeshiya Sabha |
| 46 | Verugal Pradeshiya Sabha |
| Agriculture Cluster | |
| 47 | Goat Farm - Thumbankerny |
| 48 | Mandur Farm - Mandur |
| 49 | Regional Livestock Farm - Morawewa |
| 50 | Regional Training Centre - Kanchirankudah |
| 51 | Veterinary Surgeon Office - Damana |
| 52 | Veterinary Surgeon Office - Dehiyattakandiya |
| 53 | Veterinary Surgeon Office - Eachchilampattu |
| 54 | Veterinary Surgeon Office - Gomarangadawela |
| 55 | Veterinary Surgeon Office - Irakkamam |
| 56 | Veterinary Surgeon Office - Karadiyanaru |
| 57 | Veterinary Surgeon Office - Kokkaddichcholai |
| 58 | Veterinary Surgeon Office - Lahugala |

| S.No. | Name of the Institution |
|---|---|
| 59 | Veterinary Surgeon Office - Mahaoya |
| 60 | Veterinary Surgeon Office - Morawewa |
| 61 | Veterinary Surgeon Office - Navithanveli |
| 62 | Veterinary Surgeon Office - Padavisripura |
| 63 | Veterinary Surgeon Office - Padiyathalawa |
| 64 | Veterinary Surgeon Office - Pothuvil |
| 65 | Veterinary Surgeon Office - Rithithenna |
| 66 | Veterinary Surgeon Office - Seruwila |
| 67 | Veterinary Surgeon Office - Thampalagamam |
| 68 | Veterinary Surgeon Office - Thirukkovil |
| 69 | Veterinary Surgeon Office - Thumbankerny |
| 70 | Veterinary Surgeon Office - Uhana |
| 71 | Veterinary Surgeon Office - Vaharai |
| 72 | Veterinary Surgeon Office - Valaichchenai |
| 73 | Veterinary Surgeon Office - Vavunatheevu |
| 74 | Irrigation IE Office - Thambiluvil |
| 75 | Irrigation IE Office - Thirukovil |
| Education Cluster | |
| 76 | ZEO Batticaloa West (Vavunativu) |
| 77 | ZEO Dehiyathakandy |
| 78 | ZEO Gomarangadawala |
| 79 | ZEO Kantalai |
| 80 | ZEO Mahaoya |
| 81 | ZEO Thirukkovil |
| Health Cluster | |
| 82 | Base Hospital - Dehiyatakandiya |
| 83 | Base Hospital - Mahaoya |
| 84 | Base Hospital - Pottuvil |
| 85 | Base Hospital - Pulmoddai |
| 86 | District Hospital - Damana |
| 87 | District Hospital - Deegavapiya |
| 88 | District Hospital - Mandur |
| 89 | District Hospital - Thuraineelavanai |
| 90 | Divisional Hospital - Mahiladitivu |
| 91 | MOH - Damana |
| 92 | MOH - Dehiyatakandiya |
| 93 | MOH - Eachchilampattai |
| 94 | MOH - Gomarangadawela |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 95 | MOH - Irrakkamam |
| 96 | MOH - Kantalai |
| 97 | MOH - Kuchchaveli |
| 98 | MOH - Kurinchakerny |
| 99 | MOH - Lahugala |
| 100 | MOH - Mahaoya |
| 101 | MOH - Navithanveli |
| 102 | MOH - Padavisiripura |
| 103 | MOH - Paddipalai |
| 104 | MOH - Padiyathalawa |
| 105 | MOH - Pottuvil |
| 106 | MOH - Seruwila |
| 107 | MOH - Thampalagamam |
| 108 | MOH - Thirukkovil |
| 109 | MOH - Uhana |
| 110 | MOH - Vaharai |
| 111 | MOH - Valaichchenai |
| 112 | MOH - Vavunativu |
| 113 | MOH - Vellavely |
| 114 | Ayrvedic Base Hospital - Kappalthurai |
| 115 | CAD - Damana |
| 116 | CAD - Gomarangadawela |
| 117 | CAD - Ilupadichenai |
| 118 | CAD - Lahugala |
| 119 | CAD - Mahaoya |
| 120 | CAD - Manalagama |
| 121 | CAD - Mandoor |
| 122 | CAD - Navalady |
| 123 | CAD - Navithanveli |
| 124 | CAD - Nawamedagama |
| 125 | CAD - Padavisiripura |
| 126 | CAD - Padiyatalawa |
| 127 | CAD - Pallikudiyiruppu |
| 128 | CAD - Pethalai |
| 129 | CAD - Porativupattu |
| 130 | CAD - Pothuvil |
| 131 | CAD - Rajawewa |

| *S.No.* | *Name of the Institution* |
|---|---|
| 132 | CAD - Sandunpura |
| 133 | CAD - Vaharai |
| 134 | CAD - Wanela |
| 135 | DAH - Weeragoda |
| 136 | District Ayurvedic Hospital - Dehiyatakandiya |
| 137 | Panchakarma Hospital - Kappalthurai |
| 138 | RAH - Thirukovil |
| 139 | RAH - Warankatagoda |
| 140 | Dehiyatakandiya Probation Unit |
| 141 | Kalmunai Probation Unit |
| 142 | Kanthalai Probation Unit |
| 143 | Pottuvil Probation Unit |

EOG 12 - 0167

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.